**ජාතික ආරක්ෂක අරමුදල - 2017**

**-------------------------------------------**

ජාතික ආරක්ෂක අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1985 අංක 09 දරන ජාතික ආරක්ෂක අරමුදල් පනතේ 12 (2) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. අරමුදල් පනතේ 12(4) වගන්තියේ සඳහන් අරමුදලේ කටයුතු පරිපාලනය කිරීම පිළිබඳ මාගේ වාර්තාව පහත සඳහන් ඡේදයන්හි ඇතුළත් වන අතර ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශනය මෙහි ඇමුණුම 01 ලෙසද අරමුදලට අයත් මුදල් ආයෝජනය කිරීම් පිළිබඳ ප්‍රකාශය ඇමුණුම 02 ලෙසද දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**---------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2 මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට ජාතික ආරක්ෂක අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

1991 අංක 10 දරන ජාතික ආරක්ෂක අරමුදල් පනතින් සංශෝධිත 1985 අංක 09 දරන ජාතික ආරක්ෂක අරමුදල් පනතේ 13 වන වගන්තිය ප්‍රකාරව, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පාර්ලිමේන්තුවේ සභාගත කල යුතු බැවින් එම මූල්‍ය ප්‍රකාශන පිලියෙල කර අමාත්‍යවරයාගේ අනුමැතිය සහිතව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීමද මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් කල යුතුය. එහෙත් 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විධිමත් අනුමැතියකින් තොරව ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා සහ අරමුදලේ නිළධාරීන් දෙදෙනෙකුගේ අත්සන් සහිතව 2018 මාර්තු 26 දින විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබුණි. 2007 ඔක්තෝබර් 02 දිනැති අංක පීඊඩී/45 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳව කළමණාකරණයේ වගකීම පිළිබඳ සහතිකය ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

#### 2.2.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අරමුදල විසින් ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශනවල ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7

ප්‍රමිතයෙහි 47 ඡේදය ප්‍රකාරව, ප්‍රාග්ධන වත්කමක සාධාරණ වටිනාකම එහි ධාරණ අගයේ ප්‍රමාණාත්මක ලෙස වෙනස් වන විට නැවත ප්‍රත්‍යාගණනයක් අවශ්‍ය වුවද අරමුදලට අයත් පිරිවැය රු.11,030,000 ක් වූ ඉඩම් හා පිරිවැය රු.4,520,000 ක් වූ ගොඩනැගිලි 2008 වර්ෂයෙන් පසු ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

#### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂයට අදාල රු.10,145 ක සංග්‍රහ වියදම මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණි.

**2.2.4 පැහැදිලි නොකල වෙනස්කම්**

සමාලෝචිත වර්ෂය සඳහා ආයෝජන පොලී ආදායම මූල්‍ය ප්‍රකාශන අනුව රු.99,872,801 ක් වුවත් විගණනය සිදුකල ගණනය කිරීම් අනුව එම අගය රු.101,600,942 ක් වූවෙන් රු.1,728,141 ක පැහැදිලි නොකල වෙනසක් විය.

**2.3 නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1985 අංක 09 දරන ජාතික ආරක්ෂක අරමුදල් පනතේ 3 (1) වන වගන්තිය | අරමුදල පිහිට වූ දින සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම පාලක මණ්ඩල රැස්වීම් පවත්වා නොතිබුණි. |
| (ආ) භාණ්ඩාගාර චක්‍රලේඛ | |
| (i) 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.1 (ඇ) වගන්තිය. | අනුමත කරන ලද අයවැය ලේඛනයකින් තොරව අදාල මුදල් වර්ෂයේදී කිසිදු වියදමක් නොදැරිය යුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා අරමුදල විසින් අයවැය ලේඛනයක් පිළියෙල කර අනුමත කර නොතිබුණි. |
| (ii) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය. | අරමුදලේ අරමුණු සාක්ෂාත් කර ගැනීම ඉලක්ක කර ගත් ක්‍රියාකාරකම් ඇතුළත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර නොතිබුණි. |
| (iii) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | වටිනාකම රු.18,572,415 ක් වූ කාණ්ඩ 04 ක් යටතේ වර්ග කරන ලද අරමුදලේ ස්ථාවර වත්කම් පිළිබඳ විස්තර ඇතුළත් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.95,979,933 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.66,392,540 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.29,587,393 ක වර්ධනයක් විය. පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළදී සුභසාධක වියදම රු.4,883,280 කින් වැඩි වුවද ආයෝජන පොළී ආදායම රු.34,480,696 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයේ ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ හතරක අරමුදලේ මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරිමේදී 2013 වර්ෂයේ රු. 80,688,937 ක් වූ අතිරික්තය 2015 වර්ෂය වන විට රු.48,440,571 ක් දක්වා පිරිහී තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විට එය රු.95,979,933 ක අතිරික්තයක් දක්වා වර්ධනය වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමිකය හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමෙන් අනතුරුව අරමුදලේ 2013 වර්ෂයේදී රු. 80,884,211 ක් වූ දායකත්වය 2015 වර්ෂය වන විට රු.48,625,395 ක් දක්වා පිරිහී තිබුණු නමුත් සමාලෝචිත වර්ෂයේ අවසානයට රු.96,161,368 ක් දක්වා වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

### 4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තම රාජකාරී කටයුතු ඉටුකරන අතරතුර දී තුවාල ලද හෝ මියගිය පොලිස් බලකායේ හෝ සන්නද්ධ හමුදාවල හෝ යම් සාමාජිකයෙකුගේ පවුල් වලට යම් ප්‍රතිලාභ ගෙවීම ඇතුළුව ජාතික ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීමට සහ සහතික කිරීමට වඩාත්ම හේතුවන්නේ යයි අරමුදලේ පාලක මණ්ඩලය අදහස් කරන ආකාරයට සහ කාර්යයන්ට අරමුදලට අයත් මුදල් ජනාධිපතිවරයාගේ විධිවිධාන වලට යටත්ව යොදාගැනීම අරමුදලේ පාලක මණ්ඩලයේ කාර්යය වී තිබුණි. එහෙත් පනතේ සලසා ඇති විධිවිධාන ප්‍රකාරව අරමුදල විසින් දරන ලද වියදම් එහි පාලක මණ්ඩලයේ අනුමැතිය යටතේ ජනාධිපතිතුමාගේ අනුමැතියට අනුව සිදුකර ඇතිබවට සාක්ෂි කිසිවක් විගණනයට ලැබී නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ හතරක අරමුදලේ ආදායම වූ රු.377,254,358 න් අරමුදලේ අරමුණු සඳහා භාවිතාකර පැවැතියේ සියයට 0.04 සිට සියයට 11 අතර පරාසයක එකතු වටිනාකම රු.18,745,265 ක් පමණක් විය. අතිරික්ත මුදල් අරමුදලේ අරමුණුගත කාර්යයන්ගෙන් බැහැරව ස්ථාවර තැන්පතු වල හා භාණ්ඩාගාර බිල්පතක ආයෝජනය කර පැවැති අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විට එලෙස පැවති ආයෝජන වල වටිනාකම රු.997,335,505 ක් විය.

(ඇ) විගණනයට ලද තොරතුරු අනුව මියගිය, අතුරුදහන් හා ආබාධිත රණවිරුවන් සංඛ්‍යාව 44,215 වුවත් සමාලෝචිත වර්ෂය තුල අරමුදල විසින් සිදුකර පැවැතියේ 2015 හා 2016 වර්ෂ වලදී රණවිරු පවුල්වල 5 වසර ශිෂ්‍යත්වය සමත් දරුවන් 195 දෙනෙකුට එකතු වටිනාකම රු.4,875,000 ක ඉතුරුම් තැන්පතු ප්‍රදානය කිරීම පමණක් විය.

(ඈ) පනතේ සඳහන් ද්විතික අරමුණ වූ ජාතික ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීමට සහ සහතික කිරීම සඳහා වැඩසටහන් සමාලෝචිත වර්ෂය තුලදී ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඉ) 2017 අගෝස්තු 17 දින ආරක්ෂක අමාත්‍යවරයාගෙන් ලද අනුමැතිය පරිදි අරමුදලේ ආදායමින් එක් අයෙකුට රු.750,000 ක් බැගින් රණවිරුවන් 145 දෙනෙකු සඳහා නිවාස ඉදිකිරීමට මෙත් සෙවන අර්ධ නිවාස ව්‍යාපෘතිය නමින් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටද සිදුකර පැවැතියේ රණවිරුවන් 89 දෙනෙකු තෝරාගැනීම පමණක් විය.

## 4.2 කළමණාකරණ ක්‍රියාකාරකම්

අරමුදල සතු නිවාස 03 ක් 2008 වසරේ සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ පරිහරණය සඳහා ලබාදී තිබුණු අතර ශ්‍රී ලංකා යුධ හමුදාව සමඟ කුලී ගිවිසුමකට එළඹීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි. 2017 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු නිවාස කුලී මුදල රු.2,400,000 ක් වූ අතර එයින් රු.1,200,000 ක් 2016 වර්ෂයට අදාල හිඟ මුදල් විය.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 අභ්‍යන්තර විගණනය

සමාලෝචිත වර්ෂයේ ආරක්ෂක අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන සැලැස්ම යටතේ අමාත්‍යාංශයට අයත් අරමුදල් සඳහා අභ්‍යන්තර විගණන වැඩසටහන් 02 ක් සිදුකිරීමට සැලසුම් කර තිබුණි. ඒ සම්බන්ධ වාර්තා වල පිටපත් මුදල් රෙගුලාසි 134 (3) පරිදි විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතාවයන් වරින්වර අරමුදලේ කළමනාකරණයේ අවධානය සඳහා යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) ගිණුම්කරණය | (i) | අරමුදල, සිය ගණුදෙණු වාර්තා කිරීම සඳහා වෙනම ගිණුම් කට්ටලයක් පවත්වනු වෙනුවට සිහිවටන සටහන් පමණක් පවත්වා තිබීම. |
| | (ii) | ආයෝජන පොලී ආදායම් හා ශිෂ්‍යත්ව ලාභීන් සඳහා ඉතුරුම් ගිණුම් වලට ප්‍රේෂණය කරනු ලැබූ මුදල් සම්බන්ධයෙන් ගිණුම්මය සටහන් පවත්වා නොතිබීම. |
| | (iii) | ස්ථාවර වත්කම් සටහන් කිරීමට ලේඛණයක් පවත්වා නොතිබීම. |
| | (iv) | වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් ගිණුම් 18 ක් සඳහා ලෙජර් ගිණුම් පවත්වා නොතිබීම. |
| (ආ) මෙහෙයුම් පාලනය | | කුලී ගිවිසුම් වලට එළඹ නොතිබීම, වත්කම් ප්‍රත්‍යාගණන නොකිරීම, පාලක මණ්ඩල රැස්වීම් නොපැවැත්වීම. |

**ඇමුණුම 01**

**ජාතික ආරක්ෂක අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශනය**

---

| | 2017 | 2016 |
|---|---|---|
| | රු. | රු. |
| **ආදායම්** | | |
| පරිත්‍යාග | - | 2,520 |
| ආයෝජන පොලී | 99,872,801 | 65,392,105 |
| ගෙවල් කුලී | 1,200,000 | 1,200,000 |
| | --------------- | -------------- |
| | 101,072,801 | 66,594,625 |
| **වියදම්** | | |
| කාර්ය මණ්ඩල දීමනා | 32,400 | 17,400 |
| සුභ සාධක වියදම් | 4,911,432 | 28,152 |
| ස්ථාවර වත්කම් ක්ෂය | 149,036 | 156,533 |
| | ------------- | ------------- |
| | 5,092,868 | 202,085 |
| වියදමට වැඩි ආදායම | 95,979,933 | 66,392,540 |

ඇමුණුම 02

**ජාතික ආරක්ෂක අරමුදලේ 2017 වර්ෂයේ මුදල් ආයෝජනය කිරීම පිළිබඳ ප්‍රකාශනය**

| ගිණුම් අංකය | ආයෝජනය කරන ලද ආයතනය | ආයෝජන වර්ගය | ආයෝජනය කල දිනය | ආයෝජන කාලසීමාව | 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| | | | | අවු: | රු. |
| 2 0065 12 19081 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | ස්ථාවර තැන්පතු | 2017 ජුනි 30 | 1 | 13,461,121 |
| 2 0065 12 19090 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | ස්ථාවර තැන්පතු | 2017 ජුනි 30 | 1 | 17,320,340 |
| 2 0065 12 19073 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | ස්ථාවර තැන්පතු | 2017 ජුනි 27 | 1 | 152,823,514 |
| 2 0065 11 78202 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | ස්ථාවර තැන්පතු | 2017 සැප්: 25 | 1 | 271,257 |
| 2 0065 11 86302 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | ස්ථාවර තැන්පතු | 2017 ජුලි 22 | 1 | 1,102,682 |
| 2 0065 12 17542 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | ස්ථාවර තැන්පතු | 2017 අප්‍රේල් 09 | 1 | 13,172,334 |
| 2 0065 12 17569 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | ස්ථාවර තැන්පතු | 2017 මාර්තු 24 | 1 | 90,665,893 |
| 2 0065 12 19057 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | ස්ථාවර තැන්පතු | 2017 ජුනි 27 | 1 | 111,256,821 |
| 2 0065 12 19065 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | ස්ථාවර තැන්පතු | 2017 ජුනි 27 | 1 | 130,138,204 |
| 1098429 | ලංකා බැංකුව | ස්ථාවර තැන්පතු | 2017 මැයි 09 | 1 | 63,087,334 |
| 2 0001 22 48549 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | ස්ථාවර තැන්පතු | 2017 ජනවාරි 07 | 1 | 1,493,380 |
| 1168699 | ලංකා බැංකුව | ස්ථාවර තැන්පතු | 2017 සැප්: 12 | 1 | 163,590,119 |
| 2 0065 10 25058 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | ස්ථාවර තැන්පතු | 2017 මාර්තු 31 | 1 | 400,000 |
| 2 0149 01 00129 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | ස්ථාවර තැන්පතු | 2017 ජුලි 14 | 1 | 103,195,653 |
| 1168744 | ලංකා බැංකුව | ස්ථාවර තැන්පතු | 2017 සැප්: 21 | 1 | 135,148,752 |
| LKA09118B023 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | භාණ්ඩාගාරබිල්පත් | 2017 දෙසැ: 29 | මාස 01 | 208,101 |
| එකතුව | | | | | 997,335,505 |